**කුලියාපිටිය නගර සභාව.**
**කුරුණෑගල දිස්ත්‍රික්කය.**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 26 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුලි 15 දින ද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම රු. 323,235 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල එම ශේෂය රු. 2,261,052 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ජර්නල් සටහනක් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව 2018 දෙසැම්බර් 31 දිනට තොගය රු. 10,357,706 ක් වුවද, ශේෂ පත්‍රයේ අතැති තොග වටිනාකම රු. 33,519,895 ක් ලෙස දක්වා තිබුණි. | වෙනසට හේතු හඳුනාගෙන ගැළපීම් කිරීමට කටයුතු කළ යුතුවේ. | තොග ශේෂය වැඩියෙන් ගිණුම්ගත වීමට හේතුව සොයාබැලීමේ දී වසර ගණනක් තිස්සේ ගබඩාවේ ලැබීම් ගිණුම්ගත කිරීම සඳහා විෂයභාර නිලධාරීන් ලබාදුන් ගබඩා ජර්නල් නිවැරදි නොවූ අවස්ථා නිරීක්ෂණය විය. ඉදිරියේ දී මේවා සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 02 කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල පැවති ශේෂයන් | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| | හා ඒවාට අදාළ උපයෝගී ලේඛනවල පැවති ශේෂයන් අතර රු. 8,717,998 ක නොසැසඳීම් පැවතුණි. | | |
| (ඇ) | එකතුව රු. 93,584,508 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළව තැන්පතු සහතික/ ඉතිරිකිරීමේ පාස්පොත හා විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ස්ථාවර තැන්පතුවක් නොව ඉතිරිකිරීමේ ගිණුමක් බවත්, ණයගැතියන්ගේ සාරාංශගත උපලේඛන විගණනයට ඉදිරිපත් කර ඇති බවත්, පුස්තකාල පොත් වලට අදාළව උපලේඛන තබා ගැනීම අපහසු බවත් දන්වා සිටිමි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 56,421,164 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 60,375,416 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් දිනට මුළු 31 හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් මුළු දිනට 31 හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| I. | වරිපනම් හා බදු | 15,184,287 | 16,127,292 | 13,904,787 | 12,408,429 | 15,034,287 | 15,370,630 | 12,229,277 | 10,767,844 |
| II. | බදු කුලී | 16,458,200 | 16,179,115 | 16,214,997 | 404,785 | 15,702,200 | 15,810,237 | 3,230,028 | 540,587 |
| III. | බලපත්‍ර ගාස්තු | 17,525,100 | 15,118,249 | 15,115,249 | 3,000 | 15,455,100 | 16,079,014 | 16,079,014 | - |
| IV. | වෙනත් ආදායම් | 118,697,420 | 116,129,367 | 38,488,594 | 37,925,424 | 110,722,243 | 118,105,767 | 85,160,891 | 76,665,050 |
| | එකතුව | 167,865,007 | 163,554,023 | 83,723,627 | 50,741,638 | 156,913,830 | 165,365,648 | 116,699,210 | 87,973,481 |

### 2.2.2 වරිපනම් හා බදු

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු හිඟය රු.12,384,796 ක් වූ අතර එයින් රු.6,494,901 ක් වසරක වැඩි කාලයක සිට හිඟ විය. නමුත් එම හිඟ සම්බන්ධයෙන් නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනතේ විධි විධාන ප්‍රකාරව හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | 2018.12.31 දිනට පැවති හිඟ ශේෂ අයකර ගැනීමට රතු නිවේදන බෙදා හැර ඇති අතර ඊට අදාළ ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පවතින බව දන්වා සිටිමි. |

### 2.2.3 කුලී

-------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වත්කම් කුලියට දීමෙන් දේපල 07 කට අදාළව රු. 454,785 ක් අයවීමට පැවතුණි. | හිඟ කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2018.12.31 දිනට හිඟ ශේෂයෙන් මේ වන විට රුපියල් 128,870 ක මුදලක් අයවී ඇති අතර 2019.05.30 දින වන විට රු.309,374.61ක හිඟ ශේෂයක් පවතී. |

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු. 22,672,719 ක් විය. සමාලෝචිත වර්ෂයට අදාළ උසාවි දඩ ආදායම් බිල්කිරීමට කටයුතු කර නොතිබුණි. | අයවිය යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම හිඟය අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 කාර්යය සාධනය

------------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත්ව හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු 08 ක් වෙනුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රු. 10,347,699 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. | තිරසර සංවර්ධන අරමුණු අනුව ඵලදායී ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | 2018 වර්ෂයේ අදාළ ප්‍රතිපාදන අනුව කටයුතු කරන බවටත්, 2019 වසරේ ඒවා ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවත් දන්වා සිටිමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂවල වටිනාකම රු. 54,999,271 ක් වූ අතර එයින් රු. 21,007,621 ක් වසරකට වැඩි කාලයක සිට හිඟව පැවතුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම ශේෂ ද හැකි ඉක්මනින් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි |
| (ආ) | වර්ෂ 03 කට වැඩි කාලයක සිට පැවත එන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු. 6,900,132 ක් කර්මාන්ත ණයහිමි රු.3,776,729 ක් වසර 02 ක් ඉක්ම වූ පොදු තැන්පත් රු.3,892,862 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ගෙවිය යුතු විශ්‍රාම වැටුප් මාසික වාරිකය සමඟ තවත් රු.50000 බැගින් ගෙවීමට මුදල් කමිටුව මඟින් තීරණය කර ඇති අතර තවදුරටත් නිරවුල් කළ හැකි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවකයින් තිදෙනෙකුගේ රු.81,735 ක් වූ ඇප තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඇප තැන්පත් මුදල් කාලීනව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| උඩුබද්දාව ජල පවිත්‍රාගාරයේ ජල මූලාශ්‍රයට සවිකර තිබුණු රු.2,189,152 ක් වටිනා නව ජල මෝටරය හා පරණ මෝටරය නිසි ධාරිතාවයකින් ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය. | අළුත්වැඩියා කටයුතු කඩිනමින් සිදුකර මහජන සේවය සැලසීමට කටයුතු කළ යුතුවේ. | මේ සම්බන්ධව අදාළ ආයතන වෙත ලිඛිතව දන්වා ඇති අතර එක් පොම්පයක් මගින් පමණක් දැනටමත් පොම්ප කිරීම සිදුවන බැවින් කඩිනමින් මෙම අළුත්වැඩියාවන් සිදුකළ යුතුව ඇත. එමනිසා අදාළ ආයතනය හා සම්බන්ධ වෙමින් පවතින අළුත්වැඩියාවන් සිදුකර අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු බොබ් කැට් යන්ත්‍රයක් හා ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය පිහිටි අක්කර 05 ක් පමණ වූ භූමිය සභාවට පවරා ගෙන නොතිබුණි. | පවරා නොගත් වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | RS-1684 බොබ්කැට් යන්ත්‍රය ඉදිරියේ දී පවරා ගැනීමටත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ඉඩම නගර සභාව වෙත පවරා ගැනීම සඳහා අදාළ ආයතනවල එකඟතාවය ලැබී ඇත. |

### 3.5.2 නිශ්ක්‍රීය /ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අවසානයට වටිනාකම සඳහන් නොවූ එක් වත්කමක්ද, වටිනාකම රු. 76,125,000 ක් වූ වත්කම් 03 ක් ද , දිගු කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණි. | නිශ්ක්‍රීය වත්කම්, අළුත් වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

**04.** **ගිණුම් කටයුතු හා යහපාලනය**

**-----------------------------------------**

**අභ්‍යන්තර විගණනය**

**----------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අභ්‍යන්තර විගණන ඒකකයේ නිලධාරීන්ට අනෙකුත් රාජකාරි ද පවරා තිබූ බැවින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කළ නොහැකිවී තිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයේ ස්වාධීනත්වය ආරක්ෂා වන පරිදි කටයුතු කළ යුතුවේ. | සභාවේ සිටින සේවක සංඛ්‍යාව අනුව, අභ්‍යන්තර විගණනය සඳහාම නිලධාරීන් පත් කළ නොහැකි අතර, අභ්‍යන්තර විගණනය කරන නිලධාරීන් හට අභ්‍යන්තර විගණනයට බාධාවක් නොවන රාජකාරි පවරා තිබෙන බව දන්වා සිටිමි. |